සීමාසහිත බයෝ-මෙඩ් හයිඩ්‍රෝ පවර් (පුද්ගලික) සමාගම - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත බයෝ-මෙඩ් හයිඩ්‍රෝ පවර් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 37 වන ඡේදයට අනුව, දේපළ, පිරියත හා උපකරණ පන්තියක් යනු ආයතනයක මෙහෙයුම්වල සමාන ස්වභාවයේ සහ සමාන භාවිතයෙන් යුත් වත්කම් කාණ්ඩයකි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති පරිදි, රු. මිලියන 259 ක් වූ බලාගාරයේ වටිනාකම තුළ ඉඩම සහ ගොඩනැගිල්ලේ වටිනාකම්ද ඇතුළත් විය. කෙසේ වෙතත්, එක් එක් වත්කම සඳහා වෙන වෙනම තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව 2024 දෙසැම්බර් 31 වන දිනට සමාගම විසින් ඉඩම හා ගොඩනැගිල්ල සහ බලාගාරය සඳහා වෙන වෙනම වටිනාකම් ගිණුම්ගත කර තිබුණි. එබැවින්, තක්සේරු වාර්තාව නොමැතිකම හේතුවෙන් එක් එක් සංරචකයේ වටිනාකමෙහි නිරවද්‍යතාවය සත්‍යාපනය කළ නොහැකි විය. තවද, ප්‍රමිතියේ 58 වන ඡේදයේ විධිවිධානයට පටහැනිව සමාගම විසින් ඉඩම් වටිනාකම මත ක්ෂය කිරීම ද සිදු කර තිබුණි.	එකඟ වේ. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මුළු වටිනාකම ලෙස රු. මිලියන 259 ක් ලබා දී තිබූ අතර එම අගය බලාගාරය මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨාව සඳහා භාවිතා කර ඇත. මෙම තක්සේරුවේ විස්තර ලබා දෙන ලෙස කිහිප වතාවක් ඉල්ලා සිටියද, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කිසිදු පිළිතුරක් ලැබී නොතිබූ අතර වාර්ෂික ගිණුම් අවසන් කිරීම සඳහා මුළු තක්සේරු අගය භාවිතා කිරීමට සිදු විය.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ආ)	එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත සහ උපකරණ ප්‍රමිතියෙහි 73 (සී) ඡේදයට අනුව, භාවිතා කරන ලද ප්‍රයෝජනවත් ආයු කාලය හෝ ක්ෂයවීම් අනුපාත මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 3.2 හි ගොඩනැගිලි සඳහා භාවිතා කරන ලද ප්‍රයෝජනවත් ආයු කාලය හෝ ක්ෂයවීම් අනුපාතය හෙළිදරව් කර නොතිබුණි.	එකඟ වේ. භාවිතා කරන ලද අනුපාතය වාර්ෂිකව සියයට 6 ක් වූ අතර ආයු කාලය අවුරුදු 15 කි. ඒ අනුව හෙළිදරව් කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ඇ)	එල්.කේ.ඒ.එස් - 08 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි) හි 42 වන ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ ගැලපීම් සිදු	එකඟ වේ. මෙම ඌනතා අවම කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

කිරීමෙන් තොරව, සමාලෝචිත වර්ෂයේදී රු. 321,267 ක විදුලි හා නවාතැන් ගාස්තු සඳහා උපචිත වියදම් හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා ලාභය එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වියදම් කාණ්ඩ පහකින් රු.764,389 ක මුදලක් ගිණුම්ගත කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2024 වර්ෂය සඳහා විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන ගිණුම්ගත කර නොතිබුණි.	එකඟ වේ. ඒ අනුව නිවැරදි කරනු ඇත.	උපචිත වියදම් ගිණුම්ගත කිරීමට සහ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
කොටස් අයදුම්පත් මුදල්	රු. මිලියන 169	අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අදාළ බලධාරීන්ගේ අනුමැතිය	සම්පූර්ණයෙන්ම එකඟ නොවේ. මෙම විශේෂිත අත්පත් කර ගැනීම සම්පූර්ණයෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සිදු කරන ලදී. මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨාව ලෙස රු. මිලියන 259 ක වටිනාකම අනුමත කරන ලද අතර ඒ අනුව රු. මිලියන 259 ක් ගෙවීමෙන් අත්පත් කර ගන්නා ලදී. මුළු මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨාව අතරින් රු. මිලියන 90 ක් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ නමට කොටස් මාරු කිරීම ලෙස ගිණුම්ගත කර ඇති අතර ඉතිරිය කොටස් නිකුත් කරන තෙක් කොටස් අයදුම්පත් මුදල් ලෙස ගිණුම්ගත කර ඇත.	ප්‍රමාණවත් සහ යෝග්‍ය ලිඛිත සාක්ෂි (උදා: අධ්‍යක්ෂ මණ්ඩල සංදේශය සහ තීරණය) විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 126 වගන්තිය	නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආදායම් බදු වාර්තාව, උපලේඛණ සහ වෙනත් අවශ්‍ය ලියකියවිලි සමඟ තක්සේරු වර්ෂය අවසන් වීමෙන් පසු නොවැම්බර් 30 වන දින හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, පනතේ එම විධිවිධානවලට අනුකූලව සමාගම විසින් 2023/2024 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වාර්තා ගොනු කර නොතිබුණි.	එකඟ වේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ආදායම් බදු වාර්තා ගොනු කිරීම ඉදිරියට ගෙන යාම සඳහා, ප්‍රාග්ධන දීමනා ගණනය කිරීම සඳහා ස්ථාවර වත්කම් අයිතම සඳහා වෙන වෙනම තක්සේරුවක් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතුය. මෙය සම්පූර්ණ කිරීම සඳහා දැනටමත් කටයුතු කර ඇත.	දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.
ආ) 2021 නොවැම්බර් 16 දිනැති ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 වගන්තිය සහ 2023 සැප්තැම්බර් 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 (ii)	පරිපාලිත සමාගම් විසින් අවසන් කරන ලද උපායමාර්ගික සැලසුම්, ක්‍රියාකාරී සැලසුම් සහ වාර්ෂික අයවැය මව් සමාගමට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සකස් කිරීම සහ මව් සමාගමට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ලබා දී නොතිබුණි.	පරිපාලිත සමාගම් සඳහා තනි තනිව අයවැය පිළියෙල නොකරයි. මව් සමාගම (ශ්‍රී ලංකා එනර්ජීස්) විසින් සමස්ත අයවැයක් සකස් කරන අතර 2024 වර්ෂය සඳහා අනුමත අයවැය විගණනය සඳහා දැනටමත් ඉදිරිපත් කර ඇත.	රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය.
ඇ) 2021 නොවැම්බර් 16 දිනැති ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.4 වගන්තිය.	ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ ඇමුණුම II හි දක්වා ඇති ආකෘතිය භාවිතා කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ සම්බන්ධතාවය තනි තනිව ප්‍රකාශ කළ යුතුය. රජය සතු ව්‍යවසාය හි වාර්ෂික වාර්තාවේ එක් එක්	එකඟ වේ. ඒ අනුව කටයුතු කරනු ඇත.	රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය.

	අධ්‍යක්ෂවරයාට අදාළ තොරතුරු හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් 2024 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ ලබාගෙන නොතිබූ අතර එක් එක් අධ්‍යක්ෂවරයාට අදාළ තොරතුරු වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර නොතිබුණි.		
ඇ) 2012 අප්‍රේල් 17 දිනැති ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ඇතිකරගත් ප්‍රමිතිගත විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමේ 2 වන ව්‍යවස්ථාවේ (2.2) (බී) වගන්තිය	වාණිජ මෙහෙයුම් දිනයට පෙර සහ ඉන් පසුව සෑම ඊළඟ වසරකම දෙසැම්බර් 01 වන දින හෝ ඊට පෙර, විකුණුම්කරු විසින් පහත සඳහන් දෑ ඇතුළත් වාර්ෂික පුරෝකථනයක් ලංවිම වෙත ඉදිරිපත් කළ යුතුය: (i) අපේක්ෂිත මාසික ජනන හැකියාව සහ (ii) සෑම වර්ෂයක් සඳහාම සැලසුම්ගත නඩත්තු කටයුතු, කෙසේ වෙතත්, ලංවිම වෙත ලබා දෙන ලද තත්‍ය විදුලි බලශක්තියේ ප්‍රමාණය හෝ එම බෙදාහැරීමේ වේලාවන් එම පුරෝකථනවල දක්වා ඇති ප්‍රමාණයන් හෝ වේලාවන්ට වඩා වෙනස් වුවහොත් විකුණුම්කරු ලංවිම වෙත කිසිදු වගකීමක් නොදරන අතර කිසිදු දඩ මුදලකට යටත් නොවේ. කෙසේ වෙතත්, සමාගම විසින් 2024 වර්ෂය සඳහා වාර්ෂික බලශක්ති පුරෝකථනය සකස් කර ලංවිම වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සටහන් කර ගෙන ඇත. ඒ අනුව කටයුතු කරනු ඇත.	ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ඇතිකරගත් ප්‍රමිතිගත විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමට අනුකූල විය යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

මෙම සමාගම 2023 දෙසැම්බර් 01 වන දින සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම විසින් අත්පත් කර ගෙන තිබූ අතර 2023 වර්ෂයේදී මාසයක කාලයක් ක්‍රියාත්මක විය. 2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු. 16,752,033 ක අලාභයක් වූ අතර 2023 අවසන් වූ මාසය සඳහා අනුරූප අලාභය රු. 1,019,791 ක් විය. ආදායම් අඩුවීම සහ විකුණුම් පිරිවැය වැඩිවීම මෙම පිරිහීමට හේතු විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 ඔක්තෝබර් 25 වන දින සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම විසින් සීමාසහිත බයෝමෙඩ් හයිඩ්‍රෝ පවර් (පුද්ගලික) සමාගම අත්පත් කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2025 මැයි 08 වන දින වන විටත් මව් සමාගම විසින් සපයන ලද රු. මිලියන 90 ක කොටස් ප්‍රාග්ධනය සඳහා කොටස් සහතිකය නිකුත් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. තවද, පෙර කොටස් හිමියන්ගේ කොටස් සහතික සමාගම විසින් අවලංගු කර නොතිබුණි.	කොටස් හුවමාරුව සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ 15 වන පෝරමය ගොනු කිරීමෙන් දැනටමත් අවසන් කර ඇති අතර 15 වන පෝරමයෙහි සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමට තනි අයිතිය සහතික කරයි. ඒ අනුව, පෙර නිකුත් කරන ලද කොටස් සහතික අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.	නිසි තීරණයක් ගැනීම සඳහා කොටස් ප්‍රාග්ධනය පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබා දුන් නිර්දේශ සලකා බලමින් 2023 මැයි 16 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් අනුමැතියට අනුව, සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම විසින් 2023 ඔක්තෝබර් 25 වන දින රු. මිලියන 259 ක වියදමින් බලාගාරය අත්පත් කර ගෙන තිබුණි. ඒ අනුව, තාක්ෂණික ශක්‍යතා ඇගයීම් වාර්තාවේ අපේක්ෂාවන්, සමාගමේ තත්‍ය කාර්ය සාධනය සමඟ සංසන්දනය කිරීමෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ.	2024 වර්ෂය සලකා බලන විට, අපේක්ෂිත ඊසානදිග මෝසම් වැසි අපේක්ෂිත මට්ටමින් නොතිබූ අතර ටර්බයින දෙකෙහිම ජනන ධාරිතාව අඩුවෙන් භාවිතා කර ඇත. බොහෝ අවස්ථාවල, ජල ප්‍රවාහය නොමැතිකම හේතුවෙන් ටර්බයින දෙකෙන් එකක් පමණක් ක්‍රියාත්මක කරන ලදි.	

(i) 2024 වර්ෂය සඳහා අපේක්ෂිත ආදායම සහ තත්‍ය ආදායම පිළිවෙලින් රු. මිලියන 67.3 ක් සහ රු. මිලියන 12.78 ක් විය. කෙසේ වෙතත්, සමාගම අපේක්ෂිත ආදායමෙන් සියයට 18.9 ක් පමණක් සාක්ෂාත් කර ගෙන තිබුණි.	පැවති වියළි කාලය සැලකිල්ලට ගනිමින්, 2025 වර්ෂයේදී කිසිදු බාධාවකින් තොරව වඩා හොඳ කාර්ය සාධනයක් අපේක්ෂා කරමින්, මේ අතරතුර ටර්බයින සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීමට තීරණය කරන ලදි.	විචලනයට හේතු විමර්ශනය කළ යුතුය. ඒ අනුව, නිසි තීරණයක් ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතුය.
(ii) 2023 සහ 2024 වර්ෂයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 43.9 ක සහ රු. මිලියන 44.7 ක දළ ලාභයක් උපයා ගැනීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, 2023 සහ 2024 වර්ෂයන් සඳහා තත්‍ය සංඛ්‍යාලේඛන පිළිවෙලින් රු. මිලියන 0.90 ක සහ රු. මිලියන 22.99 ක දළ අලාභයක් විය.	2025 වර්ෂයේ මුල් මාස පහ තුළ ලබා ඇති ජනන ආදායම තුළින් මෙය සනාථ කළ හැකි අතර ටර්බයින දෙකම අපේක්ෂිත කාර්ය සාධනය යටතේ පවතින අතර මිලියන 30.2 ක් ජනනය කර ඇත.	විචලනයට හේතු විමර්ශනය කළ යුතුය. ඒ අනුව, නිසි තීරණයක් ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතුය.
(iii) තවද, 2023 සහ 2024 වර්ෂයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 31.6 ක සහ රු. මිලියන 32.2 ක ලාභයක් උපයා ගැනීමට අපේක්ෂා කරන ලදි. කෙසේ වෙතත්, 2023 සහ 2024 වර්ෂයන් සඳහා තත්‍ය සංඛ්‍යාලේඛන පිළිවෙලින් රු. මිලියන 1.01 ක සහ රු. මිලියන 16.75 ක අලාභයක් විය.	තවද, 2024 වර්ෂය සඳහා වාර්තා වූ දළ අලාභයෙන් සියයට 60 ක් (රු. මිලියන 15.8) සාමාන්‍ය වියදමක් වූ වාර්ෂික ක්ෂයවීම් සඳහා විය.	විචලනයට හේතු විමර්ශනය කළ යුතුය. ඒ අනුව, නිසි තීරණයක් ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතුය.
(iv) 2023 සහ 2024 වර්ෂයන් සඳහා අපේක්ෂිත වාර්ෂික මුදල් ප්‍රවාහ පිළිවෙලින් රු. මිලියන 48.9 ක් සහ රු. මිලියන 49.4 ක් විය. කෙසේ වෙතත්, 2023 සහ 2024 වර්ෂයන් සඳහා තත්‍ය වාර්ෂික මුදල් ප්‍රවාහය පිළිවෙලින් රු. මිලියන 0.6 ක් සහ රු. මිලියන 1.14 ක් විය.		විචලනයට හේතු විමර්ශනය කළ යුතුය. ඒ අනුව, නිසි තීරණයක් ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතුය.
(v) 2024 වර්ෂය සඳහා අපේක්ෂිත වාර්ෂික බලශක්ති ජනනය ගිගාවොට් 3.6 ක් විය. කෙසේ වෙතත්, තත්‍ය වාර්ෂික බලශක්ති ජනනය ගිගාවොට් 0.72 ක් වූ අතර සමාගම අපේක්ෂිත වාර්ෂික බලශක්ති ජනනයෙන් සියයට 20 ක් පමණක් සාක්ෂාත් කර ගෙන තිබුණි.		විචලනයට හේතු විමර්ශනය කළ යුතුය. ඒ අනුව, නිසි තීරණයක් ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතුය.
අවසාන වශයෙන්, ඉහත (i), (ii), (iii) (iv) සහ (v) ට අනුව, 2023 සහ 2024 වර්ෂයන් සඳහා අපේක්ෂිත මූල්‍ය හා මෙහෙයුම් කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීමට සමාගමට නොහැකි වූ බව නිරීක්ෂණය විය.		

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.7.2 ඡේදයට අනුව ප්‍රසම්පාදන අස්ථිත්වයේ සේවක පිරිස් සහ උපකරණ භාවිතා කරමින් වැඩ ඉටුකිරීම (Force Account) සිදු කර හැක. එවැනි වැඩ ඉටුකිරීමට භාර ගැනීම සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව ප්‍රසම්පාදන අස්ථිත්වයට ඇති බව එම අස්ථිත්වය තීරණය කරන්නේ නම්, (අ) වැඩ ප්‍රමාණයන් කලින් තීරණය කිරීම දුෂ්කර වන විට; (ආ) කොන්ත්‍රාත්කරුවන් විසින් සාධාරණ මිල ගණන් යටතේ ලංසු ඉදිරිපත් කිරීම සිදුනොවිය හැකි විට; (ඇ) දැනට සිදුකරමින් පවතින වැඩවලට බාධාවක් නොවන පරිදි වැඩ ඉටුකළ යුතු වන විට; සහ (ඈ) හදිසි අවධානය අවශ්‍යවන හදිසි තත්වයන්හිදී යන අවස්ථානුගත කරුණුවලදී මෙම ක්‍රමය උචිත වේ. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ ඇතුළත් නිර්ණායක සලකා බැලීමෙන් තොරව සමාගම විසින් force account වලට සමාන ක්‍රමයක් තෝරාගෙන තිබුණි. තවද, ගොඩනැගිලි ඉදිකිරීම ඉටුකිරීම සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව සමාගම විසින් තීරණය කර නොතිබූ අතර ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දෛනික වැටුප් පදනම මත බඳවා ගත් සේවකයින් 12 දෙනෙකු සඳහා වැටුප් වියදම ලෙස රු. 5,163,151 ක් දරා තිබුණි. තවද, වර්ෂය තුළදී සිදු කරන ලද ඉහත වැඩ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි.	ප්‍රමාණ බිල්පත් සහ ඇස්තමේන්තු මත පදනම්ව, සිදුකරමින් පවතින වැඩවලට බාධාවක් නොවන පරිදි සහ හදිසි අවධානයක් අවශ්‍ය තත්වයන් යටතේ වැඩ කටයුතු සිදු කිරීම යන පදනම මත ඉදිකිරීම් කම්කරුවන් බඳවා ගෙන ඇත. කෙසේ වෙතත්, ඉදිකිරීම් කම්කරුවන්ට ගෙවන දෛනික ගෙවීම සම්පූර්ණයෙන්ම රජයේ අනුමත පළාත් දෛනික අනුපාත මත පදනම් වූ අතර සේවකයින් දොළොස් දෙනෙකු සඳහා වන රු. 5,163,151.00 ක වියදම බඳවා ගත් දින සිට වාර්තාකරණ කාලය අවසානය දක්වා වූ මාස 13 ක කාලයක් සඳහා විය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ, ප්‍රසම්පාදන අත්පොතෙහි සහ එහි අතිරේකවල විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ආ)	2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.3.1 (අ) ඡේදයට අනුව, අදාළ සියලු පිරිවැයන් ඇතුළුව මුළු ඇස්තමේන්තු පිරිවැය ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, ගොඩනැගිල්ල ඉදිකිරීම සහ උපකරණ සංවර්ධනය සඳහා සමාගම ඉහත ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 වන දිනට ඉහත සඳහන් වැඩ සඳහා දරන ලද පිරිවැය රු. 17,786,845 ක් විය.	පිළිගත නොහැක. කාල සීමාව පුරා සිදු කරන ලද සෑම ඉදිකිරීම්/නඩත්තුවකදීම වෙන වෙනම ප්‍රමාණ බිල්පත් සහ ඇස්තමේන්තු සකස් කර විගණනයට ඉදිරිපත් කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ, ප්‍රසම්පාදන අත්පොතෙහි සහ එහි අතිරේකවල විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ඇ)	2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 (අ), (ආ), (ඇ) ඡේදවලට අනුව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් (MPP) සකස්	වර්තමානයේදී, සමාගම 2025 වර්ෂය සඳහා පිළියෙල කරමින් සිටී.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ, ප්‍රසම්පාදන අත්පොතෙහි සහ එහි

	කළ යුතු අතර අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් MPP හි ලැයිස්තුගත කළ යුතුය. ඊළඟ එළඹෙන වර්ෂය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් විස්තරාත්මකව සකස් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම ඉහත අවශ්‍යතා සපුරා නොතිබුණි.		අතිරේකවල විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ඇ)	ප්‍රසම්පාදන අත්පොතේ 38 වන අතිරේකයේ 9.3.1 (ආ) ඡේදයට අනුව මෝටර් වාහන සහ උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා, රු. 500,000 ඉක්මවන අලුත්වැඩියාවන් සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, රු. 741,934 ක වාහන අලුත්වැඩියාව සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.	ප්‍රසම්පාදන අධිකාරිය පැවරීම් අනුව මිල ගණන් කැඳවීම සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය මගින් ප්‍රසම්පාදන රෙගුලාසි වල අවශ්‍යතාවයන් සපුරාලමින් අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත. මෙය පෙර වර්ෂයේ ද අනුගමනය කරන ලද ක්‍රමයම වේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ, ප්‍රසම්පාදන අත්පොතෙහි සහ එහි අතිරේකවල විධිවිධානවලට අනුකූල විය යුතුය.